**ආචාර්ය චින්තක ෆොන්සේකා**

**ෆකොළඹ ආනන්ද විද්‍යාලයේ උගෙන උසස් පෙළ විභාගෆයන් ඉහලම ප්‍රතිඵල ලබා ගනිමින් මොරටුව විශ්ව විද්‍යාලයට ඇතුල් වන චින්තක විද්‍යාර්ථියකු වශයෙන් ඉංජිනේරු පීඨයේදී දක්වන ප්‍රතිඵල නිසා රන් පදක්කමකින් සම්මානයට පාත්‍ර විය.**

**වර්ෂ 1996 වන තෙක් එම විශ්ව විද්‍යාලයේම සිවිල් ඉංජිනේරු දෙපාර්තෆමේන්තුෙ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස සේවය කළ ආචාර්ය චින්තක ෆොන්සේකා දැනට පදංචිව සිටින්නේ සිඩ්නි නුවරයි.**
**ජ්‍යෙෂ්ඨ නිර්මාණ ඉංජිනේරුවරයකු ලෙස සහ වෘත්තීය ප්‍රවර්ධන පුහුණු කටයුතු නායකයකු ලෙස දැනට කටයුතු කරන චින්තක, ඕස්ට්‍රේලියානු ඉංජිනේරු ආයතනයේ වරලත් වෘත්තීමය ඉංජිනේරු සහ ඕස්ටේලියානු ජාතික ඉංජිනේරු ලේඛණයේ ව්‍යුහ ඉංජිනේරු අංශයේ** (Sructural College) **සාමාජිකයකුද වෙයි.**

**පාසල් කාලයේ පටන්ම පන්තියෙන් බැහැර කටයුතු වල නියැළුන චින්තක, ආනන්දයේ ආරම්භය හා ව්‍යාප්තිතිය ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සාමාජිකයකුද විය. ඔහු නිව් සවුත් වේල්ස්හි ආදී ආනන්දීයන්ගේ සංගමයේ කමිටු සාමාජිකයෙකි.**

**නිව් සවුත් වේල්ස් පැරමටා සිංහල පාසල් කමිටුවේ උප සභාපති සහ නිව් සවුත් වේල්ස් සිංහල සංස්කෘතික සංගමයේ නියෝජිතයකු ලෙස කටයුතු කළ ඔහු 2002 දී සිංහල පාසල් විවිධ ප්‍රසංගය සඳහා "ඉගෙනීම ධනය වේ" සහ 2004 දී නිව් සවුත් වේල්ස් ශ්‍රී ලංකා ලලිත කලායතනයේ "රංග රිද්ම" ප්‍රසංගය සඳහා " සීගිරි කාශ්‍යප" යන නාට්‍ය ලියා අධ්‍යක්ෂණය කළේය.**

**"ලුණු රසැති තේ" "දෙමංසල" යන කෙටි කතාත්, "නොසැලෙන සෙනෙහස" නවකතාවත් චින්තක ෆොන්සේකා ලේඛකයාගේ අනෙක් කෘති වෙයි**

එකක් තියෙන බෝයි කෙනෙක් හරි මෙහෙම එව්වා කියලා...."

"අනේ අම්මි... මට ක්‍රෂ් එකක් තියෙන කොල්ලො නම් ගොඩක් ඇති... ඒත් මට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් නම් නෑ... අම්මි... සුදු ගාඩීනියා මල් වල මුකුත් විශේෂ දෙයක් තියෙනවද?"

"දුව...ගාඩීනියා මල කියන්නෙ.. හාර්ට් එකෙන්ම එන ආදරය.. ඒ වගේම බැඳීම පෙන්නන සිම්බල් එකක්... ඒ එක්කම ගාඩීනියා මලකින්.. ශක්තිය... ධෛර්යය... වගේ දේවලුත් පෙන්නනවා...."

අම්මි මෙහෙම කිව්වම මට පුදුම හිතුනා.

"අනේ අම්මි.. ගාඩීනියා මල් හරිම ගණන් නේද?... ඉතින් කාටද මට මෙහෙම මලක් එවන්න තරම් ආදරයක් තියෙන්නෙ?"

"දුව... අපිට දැනෙන්නෙ නැතුවට අපිට ආදරය කරන අය ඉන්න පුලුවන්... අන්න එහෙම කෙනෙක් වෙන්න ඕන ඔයාට මේ මල එවන්න ඇත්තෙ..."

කවුද මට මේ ගාඩීනියා මල එව්වෙ?. මේක මට හිතට වද දෙන ලොකු ප්‍රශ්නයක් වුනා.
මම මේ ගැන තුෂාරි එක්කත් කතා කරා.

"මේ නිම්මි.... මට නම් හොඳටම ෂුවර් මේක උඹට ට්‍රකයි කරන කොල්ලෙක් තමයි එවල තියෙන්නෙ... මිනිහගෙ ලව් එක උඹට පෙන්න ගන්න වෙන විදියක් නැති හින්ද මේ විදියට ගාඩීනියා මලක් එවන්න ඇති....."
"ඉතින් බන්.. එහෙම එවනව නම් කවුද කියල කියන්න ඕන නෙ..... අනික..එයා කොහොමද මගේ බර්ත් ඩේ එක දැන ගත්තෙ?"

"උඹට පිස්සුද බන්... උඹෙන් කෙළින්ම අහන්න ගට් එකක් නැති හින්දනෙ මේ වගේ මලක් එව්වෙ ඉතින් එහෙම එකේ මෑන් නමක් ලියල එවයිද..... අයියෝ බන්...කොල්ලෙක්ට ලව් එක ඔලුවට ගැහුවම කෙල්ලගෙ බර්ත් ඩේ එක හොයා ගන්න එක මාර සිම්පල් වැඩක්නෙ..."
"හ්ම්ම්... අනේ මන් දන්නෙ නෑ බන්... මට නම් මේක මාර අවුලක් තමයි....."

තුෂාරි කිව්ව වගේ මේ මල එවන්න ඇත්තෙ මට ක්‍රෂ් තිබුන කොල්ලෙක් තමයි කියල මමත් හිතුව. මේ හින්ද ඊට පස්සෙ මගේ හිතට පිරිමි ළමයි ගැන හැඟීම් ගලා ගෙන එන්න පටන් ගත්තා.

මේ අතරෙදි තමයි චාමර මගේ ජීවිතයට ඇතුලු වුනේ.

චාමරට තිබුනෙ හරිම අහිංසක පෙනුමක්. ඒ පෙනුමට මම ඇදිල ගියා කියල කියන්න පුලුවන්. තුෂාරි අතේ චාමර එයාගෙ ආදරය මට කියල එව්වම මට ඒ ආදරය අහක දාන්න බැරි වුනා. චාමරගෙයි මගෙයි ආදරය තුෂාරි ඇරෙන්න වෙන කවුරුත් දැන ගෙන හිටිය නැහැ. මගේ අම්මිට මේක කියන්න තරම් ආත්ම ශක්තියක් මට තිබුනෙ නැහැ.

චාමරයි මමයි ගොඩක් කිට්ටු වුනා. අපි දෙන්න ටියුෂන් පන්ති ඉවර වුනාම එහෙ මෙහෙ ඇවිදින්න ගියා. අපි ගොඩක්ම ගියේ පේරාදෙනිය මල් වත්තට තමයි.

"චාමර... ඇත්තටම මට අර ගාඩීනියා මල එව්වෙ ඔයා නේද?.. අනේ මට ඇත්ත කියන්නකො පැටියෝ....."

මල් වත්තෙ බංකුවක වාඩි වෙලා චාමරගෙ පපුවෙ ඔලුව තියාගෙන හිටිය මම මෙහෙම ඇහුවෙ ගාඩීනියා මලේ සිද්ධිය මගේ හිතට වදයක් වෙලා තිබුන හින්ද.

"අනේ නෑ කෙල්ලෙ... මම නෙමෙයි එව්වෙ... ඒ කොහොම වුනත් ඒ මලෙන් කියනව වගේම මම ඔයාට ආදරෙයි නිම්මි....."
"ඔය ඇත්තමද පැටියො?"
"ඔව් කෙල්ලෙ..... මම ඔයාට පණ වගේ ආදරෙයි...."

මෙහෙම වෙලාවට මට ඉවසන්න බැරුව යනවා. ඉතින් මම චාමරගෙ බෙල්ල වටේ අත් දාගෙන එයා එක්ක කිස් කරන්නෙ මුලු ලෝකෙම අමතක කරල.

ඒත්.... චාමරගෙ මේ ආදරය වචන වලට විතරක් සීමා වුන දෙයක් කියල බොළඳ ආදරයෙන් අන්ධ වෙලා හිටිය මට එදා තේරුනේ නැහැ. චාමරට ඕන කරල තිබුනේ මගේ ලස්සන ඇඟ විතරයි. එයාගෙ පහත් ආසාවල් මගේ ලස්සන ඇඟ හින්ද ඇවිස-"සිලා තිබුන කියන එක ඒ දවස්වල මට හරියටම තේරුනේ නැහැ.
චාමරගෙ මේ ආසාවල් රතු ඉර පනින්න වැඩි කාලයක් ගියේ නෑ.

"නිම්මි....."
"ම්....." එක දවසක් මල්වත්තෙ බංකුවක චාමරට තුරුලු වෙලා හිටිය මම හෙමින් කිව්ව.

"කෙල්ලෙ...මම ඔයාට ගොඩක් ආදරෙයි.... මේ ඇත්තමයි... මම මැරී කරන්නෙ ඔයාවම තමයි... මේ... ඒ හින්ද අපි හැමදාම මෙහෙම මල් වත්තටම වෙලා ඉන්න ඕන නැහැනෙ බබෝ..... මේ... ම්ම්ම්... අද.. අද.. අපි රූම් එකකට යමුද?"

චාමර මෙහෙම කිව්වම මම කරකවල අත ඇරිය වගේ වුනා. මට කියන්න ඕන මොකද්ද කියල හිතා ගන්න බැරි වුනා. මගෙත් හැඟීම් ටිකක් ඇවිස්සිල තමයි තිබුනෙ. ඒත් ඒ වෙලාවෙ මට දහසය වෙනි උපන් දිනය දවසේ අම්මි කියපු දේවල් මතක් වුනා.

"ලෝකෙ එච්චර නරක තැනක් නොවෙයි වගේම එච්චර හොඳ තැනකුත් නෙමෙයි.. ගෑණු ළමයි.. විශේෂයෙන්ම ඔයා වගේ ලස්සන ගෑණු ළමයි ගොඩක් සිහි බුද්ධියෙන් වැඩ කරන්න ඕන... "

අම්මිගෙ මේ වචන මගේ හිත පුරාම දුවන්න ගත්තා. ඒ ගැම්ම හින්ද මම හඟීම් යට කරල මොලය පාවිච්චි කරා.

"චාමර... ඔයා වගේම මමත් ඔයාට ගොඩක් ආදරෙයි... ඒත් චාමර... අනේ වෙරි සොරි.... මට බෑ ඒ වගේ දේකට කැමති වෙන්න... අනේ මාව තේරුම් ගන්න ප්ලීස් .."

චාමරගෙ මූණෙ පෙනුම එක පාරටම වෙනස් වුනා.

"හ්ම්ම්ම්ම්....." එයා කිව්වෙ එච්චරයි.

එදා ඉඳන් චාමර වෙනස් වෙන්න පටන් ගත්තා. ඊට සුමානෙකට විතර පස්සෙ මගේ හදවතේ තුවාලයක් ඇති කරල චාමර මගෙන් වෙන් වෙලා ගියා.
එදා මුලු දවසම මම ඇඬුවා. රෑට කෑම කන්න ආවේ නැති වුනාම අම්මි මගෙ කාමරේට ආවා. මගේ ඉදිමිලා රතුවෙලා තිබුන ඇස් දැක්කම අම්මිට වෙලා තියෙන දේ තේරුනා.

"අනේ අම්මීඊඊඊඊඊඊ...."
මම අම්මිව බදා ගෙන හයියෙන් අඬන්න ගත්තා. අම්මි පොඩි කාලෙදි වගේ මාව තුරුලු කර ගත්තා.

**නිම්මිට හැම උපන්දිනයකටම ගාඩිනියා මල් එව්වෙ කවුද?**
**ළබන සන්නස කළාපය බලන්න**




**Tutoring**

**22 years of experience in tutoring in Melbourne with Proven Results.......!**

*Coaching for*
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
*Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.*

**Small groups - up to 4 students.....!**
**Individual classes on request**

**Neranjana Kudaligama**
**0408 356 821**
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

**Hemantha Devendra**
**0409 854 597**
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)

**Alpha academy**
**Classes at Dandenong**

**Selective entry school exam preperation**
**Primary, Secondary, VCE**
**2015 Program**

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts, Analytical Writing

**Classes conducted by Current School Teachers**
**Contact - Sarah on 0457 908 918**
ABN 52267352093

**සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com**